සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,110 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 80 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 මාර්තු මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


79 - B 081493 — 353 (2019/02)
D 1 -

# විවිධ දැන්වීම්

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් සමාගමක් ඈවර කිරීම සඳහාවන ඉල්ලීම සම්බන්ධයෙන්වන කාරණාවේ දී ය.

ටුවර් ඊස්ට් (ලංකා) ලිමිටඩ්,
නො. 455, බිම් මහල,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

නඩු අංකය : 81/2018/CO.

ඈවර කිරීමට යෝජිත සමාගම

*එදිරිව*

දේවින් රඩොල්පේ පෙරෙයිරා,
නො. 52/03,
ජයගත් පාර,
නාවින්න,
මහරගම.

..................................*පෙත්සම්කරු.*

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් ටුවර් ඊස්ට් (ලංකා) ලිමිටඩ් සමාගම ණයගැති බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් මහරගම, නාවින්න, ජයගත් පාර, නො. 52/03 හි පදිංචි දේවින් රඩොල්පේ පෙරෙයිරා විසින් වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 30 වැනි දින මහාධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධයෙන් සහය දැක්වීමට අපේක්ෂා කරන එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායාදයෙකු නඩුව අසනු ලබන අවස්ථාවේ දී එම කාර්ය සඳහා තම නීතිඥවරයා මගින් පෙනී සිටිය හැකි බවත්, අවශ්‍ය කරන එකී සමාගමේ ණය හිමියකුට හෝ දායකයකුට ඒ සඳහා වූ නියමිත ගාස්තු ගෙවූ පසු පහත අත්සන් කළ අය විසින් පෙත්සමේ පිටපතක් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ :* නීතිඥ සනත් විජේවර්ධන,
නො. 28, විල්සන් වීදිය,
උසාවිය පාර, කොළඹ 12.

***සටහන.***- එකී පෙත්සම අසනු ලබන අවස්ථාවේ දී පෙනී සිටීම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් එසේ කිරීමට ඇති තම අපේක්ෂාව දැන්වීම ලිඛිතව ඉහත නම් සඳහන් නීතිඥ සනත් විජේවර්ධන වෙත ලබා දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. දැන්වීමේ පුද්ගලයාගේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු ය. *නැතහොත්* සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු අතර, එයට එම තැනැත්තෙකු විසින් හෝ සමාගම විසින් *නැතහොත්* (සිටී නම්) ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයකු විසින් අත්සන් කළ යුතුවන අතර, එය වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 29 වැනි දින පස්වරු 4.00ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවනු ලබන්නේ නම්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව තැපෑලෙන් එවිය යුතු ය.

නීතිඥ සනත් විජේවර්ධන,
නො. 28, විල්සන් වීදිය,
උසාවිය පාර, කොළඹ 12.

02-362

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.